යම් යම් ජාතීන්, ජාතිකයන් හැඳින්වීම සඳහා කටවහරෙහි භාවිතා වන විවිධ සෘණාත්මක යෙදුම් තිබේ. යම් කිසි අවමානාත්මක, කොන් කිරීමේ ස්වරයක් ජනිත වන මෙවැනි සෘණාත්මක යෙදුම් දිගින් දිගටම භාවිතා කිරීම ඔස්සේ විදේශික භීතිකාවක් (xenophobia) පවා ජනිත විය නොහැකිදැයි පාඨක අප ඇසිය යුතු වෙයි.

"චීනෙක් කොළඹ කොටුවේ ඇවිදින මංතීරුවක් වසා දමයි" යන සිරස්තලයෙන් යුතුව මව්බිම පුවත්පතේ (09/30) පළව තිබූ පුවත් වාර්තාවකි. කොළඹ ඇවිදින මංතීරුවක්, "චීන ජාතිකයෙකුගේ" අධීක්ෂණය යටතේ පැමිණි පිරිසක් විසින් වසා දැමූ බවට පුවතක් ඇති බව මෙහි අන්තර්ගතයේ දැක්වී තිබිණි.

මෙහිදී "චීනා" යන යෙදුම සෘණාත්මක සන්දර්භයක් තුළ යොදාගැනීම ඔස්සේ අවමානාත්මක, කොන් කිරීමේ අදහසක් ජනිත කරන්නේ යැයි ඔබ සිතන්නේද? අන්තර්ගතයේ එන "චීන ජාතිකයා" යන්න සිරස්තලය තුළ "චීනා" බවට පත් කර තිබීම පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima**